# 2021 ලෝක මිහිතල දිනය සමරමු

පරිසරය සම්බන්ධව ප්‍රකාශයට පත්කර ඇති අන්තර්ජාතික දිනයන් අතරින් සෑම වසරකම අප්‍රේල් 22 දිනට යෙදෙන ලෝක මිහිතල දිනයට හිමිවන්නේ සුවිශේෂිය ස්ථානයකි. විශේෂයෙන්ම සමස්ත ජීවයේ පැවැත්මට දායකවන මිහිතලය වෙත අවධානය යොමුකරන දිනයක් ලෙස මෙම දිනය සුවිශේෂීය වේ. ලෝක මිහිතල දිනය සතු විශේෂිතතා කීපයකි. එනම්,

- පරිසරය පිලිබඳ ලෝක ජනතා ක්‍රියාකාරීත්වයක් ආරම්භවූ වසර (1970) සමරන දිනය වීම.
- පරිසර ආරක්ෂාව ඇතිකිරීම මුල් කර ගනිමින් බිහිවූ දිනයක් වීම.
- පරිසරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහාත්, පරිසර ක්‍රියාකාරකම් සඳහා යොමුවීම සඳහාත් විවිධ සම්මන්ත්‍රණ, ජනතාව සහභාගීවන ආචාර පෙළපාලි,පෙත්සම් අත්සන් කිරීම, පරිසරය පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන, රුක් රෝපණ වැඩසටහන්, පරිසරය සුරකින බවට ප්‍රතිඥා දීම් ආදී විවිධ වැඩසටහන් ලොව පුරා ක්‍රියාත්මක කරන දිනයක් වීම.
- ලොව පුරා වෙසෙන ජනතාව බිලියනයක් පමණ එක්ව සමරන පරිසරයට අදාළ දිනයක් වීම.

## <u>ලෝක මිහිතල දිනය බිහිවීම</u>

1969 වසරේදී ඇමරිකා එක්සත් ජනපදයේ සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර යුනෙස්කෝ ආයතනයේ පැවති සමුළුවේදී එවකට ප්‍රකට සාම ක්‍රියාකාරිකයෙකු වූ ජෝන් මැක්කොනෙල් මහතා විසින් සාම සංකල්පය සමග මිහිතලයට ගරුකිරීම සඳහා දිනයක් යෝජනා කරන ලදී. පළමු වරට මෙම දිනය මිහිතල දිනය ලෙස 1970 වසරේ මාර්තු මස 21 දින උතුරු අර්ධගෝලයේ රටවල සමරා ඇත. පසුව, ඇමරිකා එක්සත් ජනපදයේ පරිසරය හා සම්බන්ධ විද්වතෙකු වූ සෙනේට් සභික ගෙලොර්ඩ් නෙල්සන් මහතා විසින් 1970 වසරේ අප්‍රේල් මස 22 දින ද මිහිතල දිනයක් සමරා ඇත. සෙනේට් සභික ගෙලොර්ඩ් නෙල්සන් මහතා විසින් එම වකවානුවේ පැවති ඇමරිකා - වියට්නාම් යුද්ධය නිසා සිදුවන පරිසර විනාශ පිළිබඳ කිසිවකුගේ අවධානය යොමු නොවන බව දැක, තෙල් කාන්දු වීම, කෘමිනාශක , දුමාරය වැනි දෙයින් පෘථිවියට වන බලපෑම් පිළබඳව මහජනතාවගේ අවධානය යොමු කරවමින් මෙම මිහිතල දින සැමරුම සිදුකර ඇත.

1970 අප්‍රේල් මස 22 දින ඇමරිකා එක්සත් ජනපද විසින් මිහිතල දිනය සමරන අවස්ථාව වනවිට ඒ සඳහා ලෝක මිහිතල දින ජාලය (World Earth Day Network) නමින් සංවිධානයක් ද පිහිටුවා ගෙන ඇති අතර එතැන් පටන් සෑම වසරකම අප්‍රේල් 22 දින ලෝක මිහිතල දිනය ලෙස සැමරීමට කටයුතු කරන ලදී.

## පළමු මිහිතල දිනයේ විශේෂතා

“නිරෝගී, තිරසාර පරිසරයක් උදෙසා කැපවෙමු” යන්න මූලික අරමුණ කරගෙන 1970 වසරේ අප්‍රේල් මස 22 දින ලොව පළමු මිහිතල දින වැඩසටහන පවත්වා ඇති අතර, එයට මිලියන 20ක් පමණ ඇමරිකානුවන් පිරිසක් සහභාගීවී ඇත. එම වැඩසටහනේදී එරට විවිධ ස්ථාන, උයන්, විදී, වෙරළ තීරයන් ආදී ස්ථානයන්වල පරිසරය පිළිබඳව රැළි පවත්වා ඇත. ඇමරිකා එක්සත් ජනපද පරිසර ආරක්ෂණ ඒජන්සිය ආරම්භවීම මෙන්ම පිරිසිදු වාතය, පිරිසිදු ජලය හා වඳවීමේ තර්ජනයට ලක්වූ ජීවී විශේෂ පිළිබඳව ද වගන්ති එරට අණ පනත්වලට ඇතුලත් වීම ද පළමු මිහිතල දිනය මූලික කරගනිමින් බිහිවිය.

## 2021 වසරේ ලෝක මිහිතල දින තේමාව සහ එහි වැදගත්කම

2021 වසරේ ලෝක මිහිතල දිනයේ තේමාව “ අපගේ පෘථිවිය යථා තත්වයට පත් කරමු (Restore our earth)” යන්නයි. මෙවර තේමාව තුලින් ස්වාභාවික ක්‍රියාවලීන් තුළින් හා නැගී එන හරිත තාක්ෂණයන් ඔස්සේ ලෝකයේ පරිසර පද්ධතීන් යථා තත්වයට පත් කල හැකි නව්‍ය චින්තනයන් කෙරෙහි අවධානය යොමුකරයි. ඒ අනුව දේශගුණ විපර්යාසයන්ට පිළියම් යෙදිය හැකි එකම ක්‍රමය අවමකිරීම (Mitigation) හෝ අනුවර්තනය වීම (Adaptation) යන මතය මෙවර තේමාව ප්‍රතික්ෂේප කරයි.

වර්තමානයේ පරිසරය හා වූ සංවේදීත්වය පසෙකලමින් කාර්මීකරණය හා නාගරිකරණය මෙන්ම හුදෙක් ආර්ථික දියුණුව කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් කේන්ද්‍රගතවීම නිසා ඇතිවූ අනිසි ප්‍රතිඵල මෑත යුගයේදී මානව වර්ගයාගේ පැවැත්ම කෙරෙහි මහත් බලපෑම් එල්ල කර ඇති බව නොරහසකි. දේශගුණික විපර්යාස, පරිසර දූෂණය , ස්වාභාවික විපත් මෙන්ම පුනර්ජනනීය සම්පත් විනාශය වැනි මෑත ඉතිහාසයේ පැන නැගුණු අර්බුදකාරී පාරිසරික ගැටළු, ගෙවුනු දශක කීපය තුළ සිදුවූ වැරදි මිනිස් ක්‍රියාකාරකම් වල අනිසි බලපෑමෙන් පැන නැගී ඒවා බැව් පැහැදිලිය.

දශක පහකට ආසන්න ලෝක මිහිතල දින සැමරුම් ඉතිහාසයක වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරමින් මෙම වසරේ ලෝක මිහිතල දින සැමරීම යෙදී ඇත්තේ පරිසරය පිළිබඳ ලෝකවාසීන්ගේ අවධානය පෙරටත් වඩා යොමුවිය යුතු පසුබිමකය.අද වන විට මුළු ලෝකයම මුහුණ දී ඇති කොරෝනා වසන්ගතයද මිනිසා සොබාදහමට එරෙහි වීම නිසා ඇතිවූ අනිටු ප්‍රතිපලයක් ලෙස පරිසරවේදීන් පෙන්වාදෙයි. එසේම සොබාදහම විසින් මිනිසාට කියාදුන් පාඩමට හිස නමමින් ලොව රටවල් කීපයක් මේ වනවිටත් තම රටවල පිහිටි වනාන්තර, වනජීවීන්, ගංගාවන් ආරක්ෂා කිරිමටත් ඒවාට මිනිසුන් සතු අයිතීන් ලබාදීමට පියවර ගැනීමත් ප්‍රසංශනීය ක්‍රියාවකි.

දිනෙන් දින උග්‍ර වන්නාවූ පරිසර අවභාවිතය මෙන්ම පාරිසරික ගැටළු හා ඒවාට විසඳුම් සේවීම පිළිබඳ සමාජ කතිකාවතක් නව මුහුණුවරකින් ඇරඹීමට වඩාත් උචිත කාලයක් දැන් එළඹ ඇත. මෙවන් මොහොතක කාලානුරූපී තේමාවක් යටතේ මිනිසා හා පරිසර අතර සමතුලිතතාවය නැවත ස්ථාපනය කරමින් ජීවය සඳහා සුදුසු මිහිතලයක් ප්‍රතිස්ථාපනය කිරීමේ මූලාරම්භයන්ට එළඹීමට මෙවර මිහිතල දින සැමරුම කදිම අවස්ථාවකි.

මෙම වසරේ මිහිතල දිනයේ තේමාව වන "අපේ පෘථිවිය යථා තත්වයට පත් කිරීම" අප සැම කෙනෙකුගේ ම යුතුකමක් වන්නේ අප සැම ඒ ගැන සැලකිලිමත් වන නිසා පමණක් නොව අප ඒ මත ජීවත්වන නිසාය. අපගේ පමණක් නොව අනාගත මිනිස් වර්ගයාගේ ද ජීවිතය, පැවැත්ම, සෞඛ්‍යය, ජීවනෝපායන් හා සතුට රඳා පවතින්නේ සුවපත් මිහිතලයක් මතය. "සුවපත් මිහිතලය" විකල්පයක් නොව අවශ්‍යතාවයකි! මෙවර මිහිතල දිනයේ දී ඒ වෙනුවෙන් පෙළ ගැසෙමු!

<u>**ලෝක මිහිතල දිනයට අපිත් මෙසේ දායක වෙමු;**</u>

- භූමි හායනය වළක්වා තිරසර භූමි කළමනාකරණයට යොමු වෙමු.
- වන වැස්ම ඉහළ නැංවීමට සහයවෙමු.
- දේශගුණික විපර්යාසයන්ට හේතුවිය හැකි ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් වෙමු .
- බලශක්තිය සංරක්ෂණයට පියවර ගැනිමු.
- හැකි සැම විටම පොදු ප්‍රවාහන ක්‍රම භාවිතයට නැඹුරු වෙමු.
- පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව වෙත යොමු වෙමු.
- අහිතකර පරිසර තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව සහිත බෝග වර්ග හා ජීවී විශේෂ සංරක්ෂණය කරමු. අදාළ ප්‍රදේශ වලට හදුන්වා දෙමු.
- ජීවී විශේෂයන්ගේ පැවැත්මට හානිකර ද්‍රව්‍ය (උදා- කෘෂි රසායන) භාවිතයෙන් වළකිමු/ අවම කරමු.
- පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කරමු.
- නිසි පරිදි කසළ බැහැර කරමු.
- හැකි සැමවිටම පරිසර හිතකාමී භාණ්ඩ භාවිතා කරමු.
- පරිසර පද්ධතිවලට හානිවන ක්‍රියාකාරකම් වලින් වලකිමු.
- ස්වභාවික සම්පත් අධිපරිභෝජනය සීමා කරමු.
- ගෙවත්තේ, පාසලේ හෝ සුදුසු ස්ථානයන්හි නිසි පරිදි රුක් රෝපණය කරමින් රෝපණය කරන ලද ශාක නිසි පරිදි නඩත්තු කරමු.
- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කර ජල සම්පත් කළමනාකරණය කරමු.
- වගකීමෙන් යුතුව පරිසර වින්දනය කරමු.
- පරිසරය පිළිබඳව නිසි පරිදි දැනුවත් වී, අන් අයටත් එම දැනුම ලබාදෙමු.
- සරල දිවි පෙවතක් ඇති කර ගනිමු.